ආයාචනාත්මක කඩහඬ අනුරාධට ඇසුණි.

ඔහු රුපියල් පන්සියයක කොලයක් දැරිය අත තැබුවේ ය.

''අද ලස්සන දවසක් දුව....'' ඔහු කීවේ ය. දැරිය ගේ පියකරු සිනාව මොහොතකට විඳ ගත් ඔහු වාහනය ඉදිරියට ගත්තේ ය

කියන්නට බොහෝ දේ ඔහු සිත තුළ විය. අසන්නට බොහෝ දේ ඔහුට සිහිපත් විය. එනමුදු ඒ කිසිවක් නොඅසා ඔහු නිහඬවම රිය පැදෙව්වේ ය. ඇගේ මුහුණේ ඇඳී තිබූ පියකරු සිනාව පමණක් වරින් වර බලන්නට ඔහු අමතක නොකළේ ය.

''පිස්සා.. සැරින් සැරේ හැරෙන්නෙ නැතිව ඉස්සරහ බලාගෙන ඩ්‍රයිව් කරන්න....'' නිෂාඩි කීප වතාවක්ම කීවා ය.

''නොබලා ඉන්න උත්සාහ කරනවා.... ඒත් ඉබේම බැලෙනවා....''

නිෂාඩි බොහෝ සැහැල්ලුවෙන් සිනාසුණා ය. ඒ සිනහවට අනුරාධ ද එක් විය.
''ඔන්න...'' නිෂාඩි කෑ ගැසුවා ය.

අනුරාධ ඉදිරියෙන් ආ වාහනයට දුටුවේ අවසාන තත්පරයේ දී ය. එයට ඉඩ දෙන්නට ඔහු සිය රථය පාරේ අයිනට ගත්තේ ය.. යම් කිසි අසාමාන්‍ය දෙයක් සිදුවන බව ඔහුට ක්ෂණයකින් දැනුණි. ඔහුට කිසිදු ආරක්ෂිත පියවරක් ගන්නට ඉඩ නොතබා වාහනයට වම් පසින් පාර ගිලා බසිනු ඔහුට දැනුණි..

''අනුරාධ....'' නිෂාඩිගේ කෑ ගැසීම ඔහුට ඇසුණේ වාහනය ප්‍රපාතයට ඇදී යද්දී ය.

0000

දිලීප වීරසේකර ගේ කාමරයට ඇතුල් වන්නට ආ සඳලි දොර අසළ නැවතුණා ය. පළමු වතාවට මේ කාමරයට ඇතුල් වන්නා සේ දොරෙහි සවිකර තිබූ නාමපුවරුව නැවත වතාවක් කියවූ ඇගේ මුවගෙහි මඳ සිනාවක් නැගුණි. ඈ සිය අතෙහි වූ කඩදාසි කීපය දෙස නැවත වතාවක් බැලුවා ය.

සුපුරුදු ලෙස දොර මඳක් ඇර කාමරයට එබී බැලූ ඇය දෙස ඔහු හිස ඔසවා බැලුවේ ය.

''....ඇතුලට එන්න ද....?'' ඈ ඉංග්‍රීසියෙන් ඇසුවා ය.
''වෙනදටත් එන්නෙ ඔහොම අහලද....?'' ඔහු නැවත පරිගණකයට ඇස් යොමන අතර කීවේ ය.

ඈ ඔහු පිටුපසින් අවුත් ඔහුගේ දෙඋරට දෑත් තබා පරිගණකයට එබී බැලුවා ය.

''මොකද කරන්නෙ....?''
''ටිකට් එකක් බුක් කරනවා.... ලංකාවට''

''හදිසියෙම....?''
''ඔව්....''
''තීසිස් එක සබ්මිට් නොකරම යන්න තරම් බරපතල කාරණාවක් ද....?''

ඔහු පිළිතුරක් නොදී හිස ඔසවා ඇය දෙස බැලුවේ ය.

''මම එක්ස්ටෙන්ෂන් එකක් ගත්තා....''

ඔහු ඇගේ ප්‍රශ්නය මගහැර පිළිතුරු දුන්නේ ය.

''මං ඇහුවෙ ඒක නෙවෙයිනෙ දිලීප'' ඈ නොපහන් බැල්මකින් ඔහුට සංග්‍රහ කළා ය. ඔහු ටික වේලාවක් කල්පනාවකට වැටී සිටියේ ය.

''නිෂාඩි ඇක්සිඩන්ට් වෙලා ....එයාගෙ යාලුවෙක් ටෙලිෆෝන් කරලා කිව්වා....'' එය ඇය විස්මයට පත් කරන ප්‍රවෘත්තියක් වනු ඇතැයි ඔහු සිතුවේ ය.

''මම දන්නවා ...'' ඈ බොහෝ සැහැල්ලුවෙන් කීවා ය.

*''ඇයි...? පුදුමයි ද...? ඔයා ඉතින් සිංහල පත්තර කියවන්නෙ නැති නිසා මෙන්න මං ප්‍රින්ට් අවුට් එකකුත් අරගෙනම ආවා... කියවලා බලන්න වටින නිව්ස් එකක්...'' ඈ සිය අතෙහි වූ කඩදාසි කීපය ඔහු ඉදිරියේ මේසය මත තැබුවා ය.*

''කොහොම ද?''

''මම විතරක් නෙවෙයි... ඉන්ටනෙට් එකෙන් සිංහල පත්තර කියවන හැම කෙනෙක්ම දන්නවා...''

''ඉන්ටනෙට් එකේ...?''

''ඇයි...? පුදුමයි ද...? ඔයා ඉතින් සිංහල පත්තර කියවන්නෙ නැති නිසා මෙන්න මං ප්‍රින්ට් අවුට් එකකුත් අරගෙනම ආවා... කියවලා බලන්න වටින නිව්ස් එකක්...'' ඈ සිය අතෙහි වූ කඩදාසි කීපය ඔහු ඉදිරියේ මේසය මත තැබුවා ය.
ඔහු ඈ දෙස විමතියෙන් බලා කඩදාසි වෙත නෙත් යොමු කළේ ය.

''ජනප්‍රිය සිනමා නලුවා හදිසි අනතුරක... පෙම්වතියටත් අසාධ්‍යයි...''

ඔහු හිස ඔසවා ඇය දෙස බැලුවේ ය.

''දිගටම කියවන්න...'' ඈ කීවා ය.

''ජනප්‍රිය සිනමා නලු අනුරාධ කීර්තිබණ්ඩාර මහතා ඊයේ නුවරඑළියේ දී සිදුවූ රිය අනතුරකින් තුවාල ලබා රෝහල් ගත කර ඇත . ඔහු සමඟ එම රියේ ගමන් කළ ඔහුගේ පෙම්වතිය වන නිෂාඩි වීරසේ-'කර ද මෙම අනතුරෙන් ...''

දිලීප කියවීම නවත්වා දකුණතින් සිය නළල පිරිමැද්දේ ය. කියන්නට වචන කීපයක් එකතු කර ගන්නට ඔහු ඒ තත්පර කීපය යොදා ගත්තේ ය.

''පත්තර කාරයෙකුගෙ අතේ රෝලක්...'' ඔහු ටික වේලාවකට පසුව කීවේ ය.

''මොකක්...?''
''අතේ රෝලක්.... ගොතපු කතාවක්..''
''වෙන්න ඇති...'' සඳලි අවඥාවෙන් සිනාසුණා ය. ''පිළිගන්න අමාරු කාරණයක්නෙ.. නේද...?''

''මනුස්සයෙක් අමාරුවේ වැටුණම හිනාවෙන්න එපා...''

''අනෙක් කාරණා ඔක්කොම අතේ රෝල් ද මොන රෝල් ද වුණත් මගේ දිලීප මහත්තයෝ... තමුන්ගෙ ප්‍රිය බිරිඳ ඒ වෙලාවෙ ඒ නලුවගේ කාර් එකේ හිටියෙ මොකද කියලා විතරක් හිතුන්න තරම් මොළයක් තිබුණොත් ඇති... ''

**ලබන කලාපයට**



කාලෙකට පස්සෙ අල්ලපු ගෙදර නංගි ආව අපිව බලන්න. ශ්‍රීපාලිට අල්ලපු ගෙදර නංගි කියන්නෙ පරණ පුරුද්දට. දැන් අපි දෙගොල්ල ඉන්නෙ හැතැප්ම විස්සක් දුරින්. කට්ටිය සපත්තු දෙර ලග ගලවල තියල, ගෙට ගොඩ වෙලා, කෙලින්ම කුස්සියේ මේසෙටයි ගියේ වාඩි වෙන්න.

* * *

''මෙන්න මං අක්කලට ගෙනාව ඊයෙ හැදුව කිරි ටොෆි වගයක්" ශ්‍රීපාලි පොඩි පාර්සලයක් මගෙ අතට දුන්න.

ආගිය තොරතුරු කතාකරන අතරෙ මං විදුලි කේතලේ ක්‍රියාත්මක කලේ තේ හදන්නයි. පොඩිවුන් දෙන්න ටී.වී එක ළග. ඒ අයට බිස්කටුයි දෙඩම් යුෂයි දීල අපි හතර දෙනා, නංගියි, සිරියි, මමයි, අපේ එක්කෙනයි, කෑම මේසෙ වටේ වාඩි උනා. මං බිස්කටුත් එක්කම කිරි ටොෆි ටිකත් මේසෙන් තිබ්බ. අපේ එක්කෙනා නම් කිරිටොෆි මරුවා. සිරිත් ශ්‍රීපාලිත් බිස්කට්ටුවක් විතරයි අතට ගත්තෙ.

''මෙන්න නංගි, මෙන්න සිරි කන්නකො" මම කිරි ටොෆි දීසිය ඒ පැත්තට තල්ලු කළා.

''අනේ අක්කෙ අපිම ගෙනල්ල අපිම කන සිරිතක් තියෙනවැයි" ශ්‍රීපාලි කියපි.

''ඒකට මක්වෙනවද නංගි, එහෙනම් ඔය බී.වයි.ඕ. පාටි තියෙන්නෙ ඕනැ තරම්."

''ඔය බී.වයි.ඕ. ප්‍රධාන වශයෙන්ම බලපාන්නෙ සැර බීම වලටනෙ. ඒක නම් හරි වැදගත් දෙයක් නොබොන අයට වඩා නොබොන අයට" අපේ එක්කෙනා, නිමල්, පරණ කතාවක් කියන්න පටන් ගත්ත.

''මීට අවුරුදු අටකට විතර කලින් අපි මෙහේ ඉන්න ලංකාවෙ එකට ඉගෙන ගත්තු කට්ටියක් එකතු වෙලා පොඩි උත්සවයක් කළා. පවුල් පණහක්, ඒ කියන්නෙ එකසිය හැත්තෑ පහක් විතර හිටිය සේරම. අපිට ගියේ වැඩිහිටියෙකුට ඩොලර් පහළොවයි. පොඩි කෙනෙකුට ඩොලර් අටයි. ඒ ගානෙන් ඩොලර් හතරක්ම ගියේ හෝල් ගාස්තුවටයි".

''ඊට මාසෙකට විතර පස්සෙ ලංකාවෙ අපේ කට්ටියගෙ ඒවගේම පාටියක් ගැන විස්තර ඊමේල් එකක් මට ලැබුන. පාටිය තිබුනෙ ආංඩුවෙ සර්කිට් බංගලාවක. අනිවාර්යයෙන්ම, ශාලා ගාස්තු, රක්ෂණ ගාස්තු නෑ. හැබැයි එක්කෙනෙකුට අය කිරීම රුපියල් හත්සිය පණහක්. ඒ දවස්වල හැටියට ඩොලර් පහලොවකට අඩු නැහැ".

''ලංකාවෙ කේටරින් එච්චර ගනන් ගිහින්ද මට හිතුණ. පස්සෙ ඊමේල් වලින් දැනගත්තු විදියට ටිකට් ගාන එච්චර සැර වෙලා තියෙන්නෙ, විස්කි වලටයි බියර් වලටයි ඇස්තමේන්තු කරපු ගණන් හින්දයි. බොන නොබොන හැමෝම එකගානට බීම වියදම් දරන්න ඕනැ!"

''ඒක නම් ඇත්ත. මටත් ඔය බී.වයි.ඕ. අදහසේ වැදගත් කම තේරුනේ මෙහෙට ඇවිල්ල ටික කාලෙකට පස්සෙයි". සිරි කතාවට හවුල් වුනා. ''බොන අය ගෙ වියදම් වලට ඇයි නොබොන අය සම්මාදම් වෙන්නෙ?"

කොයි හැටි වුනත් සිරිවත් ශ්‍රීපාලිවත් කිරි ටොෆි වලට අතවත් තිබ්වෙ නෑ. ''අපි ගෙදර ගිහින් කන්නම්කො අක්කෙ, මේ කොටස අක්කලාටමයි" අල්ලපු ගෙදර නංගි කිව්වොත් කිව්වමයි.

* * *

මටත් හොඳ පරණ කතාවක් මතක් වුනා. ''අපි මෙහෙට ආපු කාලෙ ගියා අළුත අඳුන ගත්තු පෝලන්ත ජාතික ගෙදරකට නිකං ගොඩ වෙලා එන්න. අපි යනකොට ලොකු බිස්කට් ටින් එකක් අරගෙනයි ගියේ. ඉතිං ඒ ගොල්ලො අපිට ඒ බිස්කට් ටින් එකම කඩල සංග්‍රහ කළා. හැබැයි අපි නම් ඉතිං අදිමදි නොකර කෑව බිස්කට් එකක් දෙකක්. තේ බීල, කතා බහ සතුටු සාමීචියෙන් පස්සෙ අපි එන්න ලැහැත්ති වෙලා නැගිට්ටාම මෙන්න අර බාගෙට කාපු බිස්කට් ටින් එක දුන්නෙ නැතෑ අපේ අතට ආපහු අරගෙන යන්න. අපි තුෂ්නිම්භූත වුනාම තමයි ඒ ගොල්ල කිව්වෙ කතාව."

''ඒ අය හිතල තියනව අපි බිස්කට් ගෙනාවෙ අපිට කන්න නම්, ඒ ගෙනාපු කෑම කාල ඉතුරු වෙන ටික අරගෙන යෑම බැරිවෙලාවත් අපේ චාරිත්‍රයක් නම් එහෙම නොදුන්නොතින් සිත් නරක් වෙයි කියල. පස්සෙ අපි දෙගොල්ලන්ටම හිනා ඒ ගැන."

''ඇයි, ඊට පස්සෙ ඒ පෝලන්ත මනුස්සය කියපු කතාව මතක නැද්ද?" නිමලුත් කතාවට එකතු වුනා.

''එයා පෝලන්තෙදි හොඳ ඔපෙරා සංගීතඥයෙක්. මෙහෙ ගෲප් එකක ගිටාර් ගහනව. මිනිහ කිව්ව සමහර වෙඩින් පාටි වල පවා පැය තුන හතර එක දිගට සෙල්ලම් කලත් වතුර උගුරක් වත් හම්බ නොවෙන දවස් තියෙනව කියල. ගාස්තුව විතරයි, සංග්‍රහයක් නැහැ. හරි පුදුමයි."

* * *

''ඒකට ලංකාවෙ. ඉස්සර මගුල් ගෙවල්වල නම් වෙනම පිරිසක් දල ඉන්නව හැමෝටම කෑම බෙදන්න මදියි නොකියන්න. කෑම කොච්චර අහක යනවද?" අපේ එක්කෙනා උත්තර බැන්ද.

''ඒ ඉස්සර කාලෙ, හැබැයි දැන්නම් කොහෙත් බුෆේ, බෙද ගන්න තරමක් තමා කෑම. කන තරමක් තමා බෙද ගැනීම".

''ඇයි කුකුල් මස් බෙදන්න විතරක් කෙනෙක්ව දනව නේද?"

නංගිගෙ කතාව අහල අපිට ගිය හිනාවෙ නතර වුනේ සිරි ගෙ වචන වලින්.

''ආගන්තුක සත්කාර, දන මාන, කොච්චර හොඳ සංකල්ප වුනත් ලංකාවෙ අදත් කෙරෙන ලොකු වරදක් තමා මල ගෙවල් වල සිගරැට් වලින් සංග්‍රහ කිරීම. නිකම්ම වරදක් නෙමේ ලොකු පවක්"!

''ඒකනෙ කියන්නෙ, අවමංගල දැන්වීමෙ බී.වයි.ඕ. සිගරැට් කියල දැම්මනං ඉවරයිනෙ".

අල්ලපු ගෙදර නංගි ඔය වගෙ කතා වලට කවදත් රුසියා.

**අල්ලපු ගෙදර අක්කා**

කරන්නෙ ජේ.වී.පී. කන්නෙ චීස්. ඒ කතාව ලබන කලාපයෙන් කියවන්න.